ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

1993 අංක 18 දරන
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1993 අප්‍රේල් මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

1993 අංක 18 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1993 මාර්තු මස 31 වන දින]

.ඩී.—ඕ. 04/90

80 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව ින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1993 අංක 18 දරන සේවා නියුක්තයන්ගේ ර අරමුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් නු ලබන, 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර මුදල් පනතේ 23 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ ව, මෙහි පහත දැක්වෙන අතුරු වගන්තිය එකතු කිරීමෙන්, සින් සංශෝධනය කරනු ලැබේ:—

1980 අංක 46 දරන පනතේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

“එසේ වුවද (ii) වන සහ (iv) වන ඡේදවල සඳහන් යම් සේවයක සේවා නියුක්තයකු විසින් දරනු ලැබූ විශ්‍රාම වැටුප් රහිත තනතුරක්, පසුව, ඒ විශ්‍රාම වැටුප් රහිත තනතුරෙහි ඔහු ප්‍රථම වරට සේවා නියුක්තියෙහි යොදවනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි විශ්‍රාම වැටුප් සහිත බවට පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ තනතුර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් බවට පත් කරනු ලැබූ දිනයේ දී අරමුදලේ ඒ සේවා නියුක්තයාගේ පෞද්ගලික ගිණුමේ බැරට තිබුණු දායක මුදල් ප්‍රමාණය, ඔහුගේ සේවා යෝජක වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.”.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (3) වන උපවගන් යට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් රීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(3අ) මේ පනතේ විධිවිධාන යටතේ නාමිකයකු නම් කොට නොමැති අවස්ථාවක, ඒ සාමාජිකයා සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ පිහිටුවනු ලැබූ සේවක අර්ථසාධක අරමුදලේ හෝ ඒ පනත යටතේ අනුමත කරනු ලැබූ අර්ථ සාධක අරමුදලක හෝ සාමාජිකයකු ද වේ නම්, ඒ පනත යටතේ සාදනු ලැබූ නියෝග යටතේ නම් කරනු ලැබූ යම් නාමිකයකු, මේ පනත යටතේ නම් කරනු ලැබූ නාමිකයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනතේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නාමිකයා සම්බන්ධයෙන් ද අදාළ වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 37 අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :—

“පැහැර හැරී සේවා යෝජකයන් විෂයයෙහි අධිභාරයක් පැනවීම.

37අ. දායක මුදල්වලට අදාළ චාර වාර්තාවක් සපයන ලෙස මේ පනතින් හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයකින් හෝ මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ යම් විධානයකින් නියම කරනු ලැබූ සේවා යෝජකයකු, එකී පනතේ, නියෝගයේ හෝ විධානයේ සඳහන් කාලසීමාව ඇතුළත ඒ වාර්තාව සැපයීම පැහැර හැරියහොත් හෝ සාවද්‍ය හෝ අසම්පූර්ණ වාර්තාවක් සැපයුවහොත් සහ එකී කාල සීමාව ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, ඒ වාර්තාව සැපයීම පැහැර හැරීමට හෝ සාවද්‍ය හෝ අසම්පූර්ණ වාර්තාවක් සැපයීමට හේතුව මණ්ඩලයට ඒත්තු යන පරිදි නැතහොත් තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය දෙනු ලැබූ නිලධරයකුට ඒත්තු යන පරිදි දැක්වීමට ඒ සේවායෝජකයාට නොහැකි වූවහොත්, ඒ වාර්තාව සැපයිය යුතු වන්නේ යම් දිනයක දී ද නැතහොත් යම් දිනයකට පෙර ද, එදින සිට යථා පරිදි සම්පූර්ණ සහ නිරවද්‍ය වාර්තාවක් මණ්ඩලය වෙත ලැබෙන දිනය දක්වා කාලය වෙනුවෙන් ඒ වාර්තාවට සම්බන්ධ දායක මුදල් ප්‍රමාණය සම්බන්ධයෙන් සෑම සම්පූර්ණ මාසයකට හෝ ඉන් කොටසකට සියයට එක බැගින් වූ අධිභාරයක් අරමුදලට ගෙවීමට ඒ සේවා යෝජකයා යටත් වන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන ගන්තිය ංශෝධනය රීම.

5. 1988 අංක 47 දරන පනතින් සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) “ඉපැයීම්” යන්නෙහි අර්ථ කථනය වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

“ඉපැයීම්” යන්නෙන් පහත දැක්වෙන දේ අදහස් වේ :—

(අ) වේතන, වැටුප් හෝ ගාස්තු ;

(ආ) ජීවන වියදම් දීමනාව, විශේෂ ජීවන වියදම් දීමනාව සහ වෙනත් යම් දීමනා ;

(ඇ) නිවාඩු දින සම්බන්ධයෙන් කරනු ලබන ගෙවීම් ;

(ඇ) සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ සාදනු ලැබූ නියෝගවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි, සේවා යෝජකයා විසින් සේවයේ නියුක්ත කොට ඇති සේවා නියුක්තයන්ට සපයනු ලැබූ පිසින ලද හෝ නොපිසින ලද යම් ආහාරයක් මිලට ගැනීමේ දී ගෙවන ලද වටිනාකම් සහ එසේ සපයන ලද යම් ආහාරයක් පිළියෙළ කිරීමේ දී හෝ සංයෝග කිරීමේ දී භාවිත කරන ලද යම් ද්‍රව්‍යයක් මිලට ගැනීමේ දී ගෙවන ලද වටිනාකම, තව ද, ඒ වටිනාකම කම්කරු කොමසාරිස්වරයා වෙත අභියාචනය කරනු ලැබීමට යටත්ව, සේවායෝජකයා විසින් තක්සේරු කරනු ලැබිය යුතු අතර, එවැනි අභියාචනයක් සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයාගේ තීරණය අවසානාත්මක වන්නේ ය.

(ඈ) ආහාර සඳහා දීමනා ; සහ

(ඉ) සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ සාදනු ලැබූ නියෝගවලින් නියමිත වෙනත් ආකාරයේ පාරිශ්‍රමික.";

(2) "සේවායෝජකයා" යන පදයේ අර්ථ කථනයෙහි "සමාගම, සංස්ථාව හෝ වෘත්තීය සමිතිය" යන වචන වෙනුවට "සමාගම, සංස්ථාව, පළාත් පාලන ආයතනය හෝ වෘත්තීය සමිතිය" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.